01. හැඳින්වීම හා ගමේ නම නිර්මාණය වූ අයුරු

වර්ෂ 1900 ට ආසන්න කාලයක් කැලෑබද ප්‍රදේශයක් වූ යගිරල රක්ෂිතයේ කොටසක්ව පැවති මෙම ප්‍රදේශය වර්ෂ 1939 හෙන්රි මුවර් ආණ්ඩුකාරවරයා විසින් මධ්‍යම ප්‍රාන්තිකයන්ට දීමනාවන් (Gran) මගින් පෞද්ගලික ඉඩම් කට්ටි ලෙස ලබා දී ඇත. මෙම ඉඩම් කට්ටි අක්කර 5 සිට අක්කර 30 පමණ ආදී වූ ප්‍රමාණයකින් බදු ක්‍රමය යටතේ බෝග වගාව සඳහා පවරා දී ඇත. යගිරල රක්ෂිතයේ මෙම කොටසේ හල් ගස් වලින් ගහන ප්‍රදේශයක් වූ බැවින් හලවල්කැලේ නමින් ප්‍රසිද්ධ වී ඇත.

මෙම ප්‍රදේශයේ වැඩි පිරිසක් පෞද්ගලික වතුවල සේවය කරන වතු කම්කරුවන්ගෙන් සමන්විත වේ. 1939 ආරම්භ කරන ලද හලවල්කැලේ ප්‍රාථමික විද්‍යාලය මෙම වතු කම්කරුවන්ගේ දරුවන් අධ්‍යාපනය ලබන රජයේ පාසල වේ. ආගමික මධ්‍යස්ථානයවනුයේ හලවල්කැලේ ශ්‍රී විවේකාරාමය විහාරයයි.

02. වසමේ පිහිටීම.

උතුරින් 848 - B [redacted], ලිහිණියාව බටහිර වසමෙන් ද, දකුණින් ගුලවිට උතුර වසමෙන් ද, බටහිරට ඌරගොඩ නැගෙනහිර වසමට ද, දොඩම්පිටිය ගම් වලට ද, නැගෙනහිරට 849 G බෝගොඩකන්ද වසමට ද මායිම්ව පිහිටා ඇත.

- අංශය - ග්‍රාමීය
- පොලිස් බල ප්‍රදේශය - වැලිපැන්න
- සෞඛ්‍ය බල ප්‍රදේශය - මීගහතැන්න
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට දුර - 13 km
- සම්පූර්ණ භූමි ප්‍රමාණය - අක්කර 900 ක් පමණ
- උප්පැන්න/මරණ ලියාපදිංචි කොට්ඨාසය - මීගහතැන්න
- ජන ගනත්වය - හෙක්ටයාර් 1 ට 0.91

03. වසමට අයත් ගම් :

- මල්වතුකන්ද
- රන්වල කන්ද
- ඉනිමං කන්ද
- පිටොස්කන්ද
- හේන්යාය

භූමියේ ස්වභාවය : කඳු සහිත ප්‍රදේශයකි.

04. වසමට ළඟා විය හැකි ආකාරය

I. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට

වලල්ලාවිට, මතුගම ප්‍රධාන මාර්ගයේ 13 km පමණ බස්රථයෙන් පැමිණ ලිහිණියාව - හලවල්කැලේ හන්දියෙන් බැස, හලවල්කැලේ මාර්ගයේ 2km පමණ පැමිණි පසු 848 - C හලවල්කැලය/මල්වතුකන්ද ග්‍රාමනිලධාරී වසමට ළඟා විය හැක.

II. මතුගම නගරයේ සිට

මතුගම, වලල්ලාවිට බස් රථයෙන් 11 km පමණ පැමිණ හලවල්කැලේ හන්දියෙන් බැස දකුණුපසින් ඇති හලවල්කැලේ මාර්ගයේ 2 km පමණ ගමන්ගත් විට 848 - C හලවල්කැලය/මල්වතුකන්ද ග්‍රාමනිලධාරී වසමට ළඟා විය හැක.

05. ජනගහන තොරතුරු

ජනවර්ගය අනුව

ජාතිය	ස්ත්‍රී	පුරුෂ
සිංහල	243	229
දෙමළ	69	83
මුස්ලිම්	07	05

ආගම් අනුව

ආගම්	ස්ත්‍රී	පුරුෂ
බෞද්ධ	243	229
හින්දු	69	83
ක්‍රිස්තියානි	07	05

වයස් කාණ්ඩ අනුව

වයස් කාණ්ඩය	ස්ත්‍රී	පුරුෂ
අවු 05 ට අඩු	40	34
අවු. 05 - අවු. 14 දක්වා	64	57
අවු. 15 - අවු. 18 දක්වා	134	125
අවු. 19 - අවු. 30 දක්වා	37	46
අවු. 30 - අවු. 60 දක්වා	19	25
අවු 60 ට වැඩි	25	30
එකතුව	**319**	**317**